කාලීන සටහන

අනාගතයට සරිලන ශක්තිමත් රාජ්‍යයක් ගොඩනංවන්නේ කෙසේද?

ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම දැන් දැන් අපට දැනෙමින් තිබේ. ඒ දැනීම තුළ එක් පැත්තකින් සමාගම් විශාල සංඛ්‍යාවක් වැසී යමින් තිබේ. අපට විදේශ විනිමය උපයාදෙන ප්‍රධාන ව්‍යාපාර කීපයක් බංකොලොත් වෙමින් තිබේ. මේ නිසා රැකියා අවස්ථා අහිමිවීම, ආදායම් මාර්ග ඇනහිටීම සිදුවනු ඇත. එය බරපතල තත්ත්වයකි. අනෙක් අතට රජයේ අධික වියදම් හා දූෂණය නිසා උද්ධමනය ඉහළ යනු ඇත. මේ පසුබිම යටතේ අගෝස්තු මාසය පමණ වනවිට ලංකාව ඉතාම බරපතල තත්ත්වයකට මුහුණදීමට ඇති ඉඩකඩ වැඩිය.

නීතිඥ
ශිරාල් ලක්තිලක

ධර්මය සහ වයඹ පළාත් ඡන්ද මේ වනවිට අවසාන වී තිබේ. ඒ වගේම බස්නාහිර පළාත් සභාව විසුරුවා හැර ඡන්දය පැවැත්වීමට කටයුතු යොදා තිබේ. ඒ නිසා මේ අවස්ථාවේ අවධානය යොමුකළ යුත්තේ පළාත් සභා ඡන්ද රැල්ල සහ ඉන් ඔබ්බට යන දේශපාලනය කුමක්ද යන්න ගැනය. උතුරුමැද සිට මධ්‍යම සහ වයඹ දක්වාත් එතැනින් බස්නාහිර පළාතත් ඉන් පසුව පැමිණෙන උඹව සහ දකුණ පළාත් සභා ඡන්දත් පැවැත්වෙන්නේ පවතින රජයේ බල දේශපාලනික ව්‍යාපෘතියේ න්‍යාය පත්‍රයකට අනුවය. ඒ තුළ අපේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම බරපතල ආකාරයෙන් උල්ලංඝණය වීමක් පෙනෙන්නට තිබේ.

න්‍යායාත්මකව ගතහොත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනතාව සහ මහජන නියෝජිතයන් අතර තිබෙන සම්මුති ප්‍රකාශයට පත්වන ක්‍රමයයි. එහිදී ජනතාව තම නියෝජිතයන් තෝරා පත්කර ගත යුත්තේ සම්මුති ගත කාලයක් ඇතුළතය. ඒ සම්මුතිගත කාලය තුළ බොහෝ විට සෑම ඡන්දයක්ම එකවර පැවැත්වීමට නියමිතය. ඇමරිකාව ගත්ත ද ඉන්දියාව ගත්ත ද ඒ රටවල සියලු මැතිවරණ බොහෝ විට එක් කාලයක පවත්වනු ඇත. ඒ පැවැත්වීම තුළ එක් පැත්තකින් මහජන මුදල් විශාල වශයෙන් ඉතිරිකර ගැනීමට උදාහරණයක් වශයෙන් ඡන්දවලට රාජ්‍ය නිලධාරීන් යෙදවීම පෙන්වාදිය හැකිය. විවිධ අවස්ථාවල පවත්වන ඡන්දවල රාජ්‍ය නිලධාරීන් යෙදවීම නිසා යන වියදම වැඩිය. එහෙත් එක් කාලයක දී මැතිවරණ පවත්වා අවසන් කරන්නේ නම් මේ මුදල් ඉතිරිකර ගැනීමට හැකිය.

එකවර ඡන්ද පවත්වන්නේ නම් සියලුම පක්ෂවලට තරග කිරීමට සාධාරණ අවස්ථාවක් ලැබෙනු ඇත. එහෙත් රජයේ න්‍යාය පත්‍රය අනුව විටින් විට මැතිවරණ පැවැත්වීම නිසා ඒ අවස්ථාව අහිමි වනු ඇත. පළාත් සභා හෝ වෙනත් ඡන්ද රජය පවත්වන්නේ රජයට වාසිදායක පසුබිමක් යටතේය. ඒ නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික මූලධර්මයක් වන එක් පුද්ගලයකු එක් ඡන්දයයි එක වටිනාකමයි කියන සංකල්පය උල්ලංඝණය වනු ඇත. මේ තුළ පවතින රජයේ නියෝජිතයන්ට විශාල වාසියක් ලැබෙනු ඇත. පසුගිය ඡන්දවලින් එම කරුණ මනාව ඔප්පු කර තිබේ.

17 වැනි සංශෝධනය යටතේ පිහිටුවිය යුතු මැතිවරණ කොමිසම පිහිටු නොවීමත් මැතිවරණ කොමිසම යටතේ තිබෙන බලතල මැතිවරණ කොමසාරිස්වරයා භාවිත නොකිරීමත් නිසා මේ තත්ත්වය තවත් තිව්වි තිබේ.

රාජ්‍ය මාධ්‍ය භාවිතය පිළිබඳ නිර්නායක නිකුත් කිරීමේ හැකියාව 17 වැනි සංශෝධනය අනුව මැතිවරණ කොමසාරිස්වරයාට තිබේ. එහෙත් පසුගිය ඡන්ද ගණනාවකින්ම පැහැදිලි වන්නේ මැතිවරණ කොමසාරිස්වරයා එම නිර්නායක භාවිතකර නැති බවය. ඒ නිසාම රාජ්‍ය දේපල විශාල වශයෙන් එක් පක්ෂයක් භාවිත කිරීම නිසා අනෙක් පක්ෂවලට අගතියක් සිදුවී තිබේ. ඒ වගේම රාජ්‍ය දේපල භාවිතය පාලනය කිරීමේ බලතල මැතිවරණ කොමසාරිස්වරයාට තිබේ. එහෙත් එය සිදු වන්නේ නැත. ඡන්ද නිලධාරීන් යෙදවීම පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාට තිබෙන බලතල ඒ ආකාරයෙන් යෙදවෙන්නේ නැත. මේ පසුබිම යටතේ මැතිවරණ පැවැත්වෙන්නේ ඒකපාක්ෂික මැතිවරණ වශයෙනි. මෙහිදී මහජනතාවට මෙන්ම අනෙක් පක්ෂවලටත් විශාල වශයෙන් අසරණ වී උකටලී වී බලා සිටීමට සිදුවන තත්ත්වයක් නිර්මාණය වී තිබේ.

මේ ව්‍යුහාත්මක ප්‍රශ්නය ගැන ඒ ආකාරයෙන් විශ්ලේෂණයක් කරන අතර ඡන්ද පවත්වන කාල වකවානු පිළිබඳවද පවතින රජයේ සිහිවිලි ඉතා වැදගත්ය. මේ කාලය රජයේ ජනප්‍රිය කාලයක් බව රජය හොඳින් වටහාගෙන තිබේ. යුද්ධය සාර්ථකව නිමා කරමින් තිබීම නිසා රජයට වාසි සහගත තත්ත්වයක් උදාවී තිබේ. යුද්ධය නිවැරදිව කිරීම නිසා ලබන ජයග්‍රහණවල වාසිය ජනාධිපතිවරයා ඇතුළු ඒ දේශපාලන පක්ෂය ලබා ගැනීම හරිද වැරදි ද යන්න මේ අවස්ථාවේ බොහෝ දෙනා සාකච්ඡාවට ලක්කරන කරුණකි. යුද ජයග්‍රහණවල දේශපාලන වාසිය රජය ලබා ගත්තාට කිසි ප්‍රශ්නයක් නැත. එහෙත් ඒ තුළ යම්කිසි දේශපාලන සදාචාරයක් ගැබ්විය යුතුය. එම දේශපාලන සදාචාරය තුළ යම් කරුණු අන්තර්ගත විය යුතු බව අපගේ අදහසය. ජනතාවට තොරතුරු ලබාදීමේ අයිතිය තහවුරු කිරීම ඉන් එකකි. එත්තත්වය ගතහොත් ජනතාවට තොරතුරු ලබාදීමේ අයිතිය රජයේ මාධ්‍යවලත් පුද්ගලික මාධ්‍යවල වක්‍රාකාරවත් සීමා කර තිබේ. එහිදීත් සමාජයට විශාල අවාසියක් සිදුවන බව පැහැදිලිය.

දෙවනුව ගතහොත් විරුද්ධ මත දරන්නන්ට ඒ මත දැරීමට තිබෙන අයිතිය උල්ලංඝණය වී තිබේ. උදාහරණයක් වශයෙන් ගතහොත් සිරස මාධ්‍ය ආයතනයට පහරදීම, ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය, රිවිර කර්තෘ උපාලි තෙන්නකෝන් මහතාට පහරදීම ඊට පෙර කීත් නොයාර්ට පහරදීම හරහා යම් භීතියක් සමාජයේ ඇතිකර තිබේ. ඒ භීතිය තුළ බොහෝ විට සෘජු වාරණයක් නැති වුවත් වක්‍ර වාරණයක්, ස්වයං වාරණයක් පනවා ගැනීමට මාධ්‍යවේදීන් යොමු වී ඇති ආකාරයක් දැකගත හැකිය. මේ නිසා සාධාරණ විශ්ලේෂණයක්, තොරතුරු ජනතාවට අහිමි වී තිබේ.

සමස්ත සමාජයම වෙලා ගනිමින් පවතින ඒකපාක්ෂික ස්වරූපය ඊළඟට තිබෙන ප්‍රශ්නයයි. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන පදනම වන්නේ පක්ෂ සහ විපක්ෂ දේශපාලනයට තිබෙන අයිතියයි. එහෙත් ඒ අයිතිය බොහෝ හිංසන ක්‍රියා හරහා වළක්වා තිබේ. මේ නිසා රජය තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිය ගැන ඒකපාක්ෂිකව කතා කිරීමට යොමුවී ඇති ආකාරයක් දැකගත හැකිය. මධ්‍යම සහ වයඹ පළාත් සභා ඡන්ද පැවැත්වෙන අවස්ථාවල රජයේ ඇමැතිවරු ප්‍රකාශ කර තිබුණේ තරගයක් දීමට කිසිවකු නොමැති බවය. අනෙක් අයගේ අත්, කකුල්, කට බැඳ තිබෙනම් තරගයක් දෙන්නේ කෙසේද යන ප්‍රශ්නය මතුවනු ඇත.

ඒකපාක්ෂික මැතිවරණ

එක් පැත්තකින් මේ මැතිවරණවලට විශාල වශයෙන් මුදල් වැයවනු ඇත. ඒ දෙස බලනවිට රජය සිටින්නේ වාසිසහගත තත්ත්වයකය. එයට හේතුව රාජ්‍ය සම්පත් භාවිත කිරීමට හැකිවීමය. එහෙත් විපක්ෂයට ඒ ආකාරයෙන් මූල්‍ය සම්පත් භාවිත කිරීමේ හැකියාවක් නැත. එක් පැත්තකින් ඔවුන්ට මුදල් නැත. ඔවුන්ගේ හිතවතකු හෝ ව්‍යාපාරිකයන් විපක්ෂයට මුදල් දීමට දක්වන්නේ බියකිනි. එයට හේතුව වන්නේ විපක්ෂයට මුදල් දීම නිසා රජය තරහ කරගෙන ව්‍යාපාරික අවස්ථා අහිමිකර ගැනීමට ඔවුන් අකමැති වීමය. මේ තත්ත්වය යටතේ වර්තමානයේ දක්නට ලැබෙන්නේ යම් පැසිස්ටි ප්‍රවණතාවක් බව මාගේ අදහසය. තනි පක්ෂයක් බලයට ගෙන ඒම සඳහා ව්‍යුහාත්මක හා කාර්ය පරිපාටිකව සහ ආකල්පමය වශයෙන් පරිසරයක් ඇතිකර තිබේ. මෙය අපට අලුත් දෙයක් නොවේ. සිම්බාබ්වේ දේශයේ පවතින්නේ මෙවැනි තත්ත්වයකි. විදේශ රටවලින් කොතරම් විවේචන එල්ල කළත් මුගාබේ රජය එරට ජනතාව අතර ජනප්‍රියය. එම ජනප්‍රියතාව පවත්වාගෙන යන්නේ ඒක පාක්ෂික ජනමාධ්‍ය භාවිත කිරීම, විපක්ෂයට දේශපාලනය කිරීමට ඇති අයිතිය සීමා කිරීම, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය සීමා කිරීම ආදී ක්‍රියාමාර්ග හරහාය.

කෙසේ වුවත් ඊළඟට මතුවන ප්‍රශ්නය වන්නේ මේ ආකාරයට එකපිට එක ජයග්‍රහණ ලබා ගනිමින් ඉදිරියට යාම තුළ ලංකාවේ අනාගතය කවර තත්ත්වයකට පත්වේද යන්නය. මා දකින ආකාරයට ලංකාවේ අනාගතය භයානක තත්ත්වයකට පත්වෙමත් තිබේ. යථාර්ථය ජනතාවට වසන් කරන තත්ත්වයකට පත්කරන අතර අනෙක් පැත්තෙන් ජනතාව යුද ජයග්‍රහණ ගැන විශාල සතුටක් භුක්ති විඳිමින් සිටින අවස්ථාවේ වෙනත් කරුණු ගැන අවධානය යොමු කරන්නේ නැත. මේ පසුබිම යටතේ අද සමාජයේ බරපතල ප්‍රශ්න තුනක් පෙනෙන්නට තිබේ. දූෂණය ඉන් එකකි. විශාල වශයෙන් සිදුවන දූෂණය හේතුවෙන් ලංකාවේ සම්පත් බරපතළ ආකාරයෙන් උපයන්නේ මිලියනයකි. කෙරවලපිටිය තාප බලාගාරයෙන් වසරකට අහිමිවන මුදල බිලියන තිහකි. මේ ආකාරයේ උදාහරණ රාශියක් ඉදිරිපත් කිරීමට පුළුවන. පොඩි මිනිසුන් දූෂණයකට සම්බන්ධ වුවොත් ඔවුන් නීතියේ රැහැනට හසුකර ගත්තද ලොකු මිනිසුන් එසේ හසුකර ගන්නේ නැත. එයට හේතුව අල්ලස හෝ දූෂණය විමර්ශන කොමිසම් අකර්මන්‍ය වී තිබීමය. එහි විමර්ශන නිලධාරියෙක් නැත. එහි කොමිෂන් සභාව පත් කිරීම ප්‍රශ්න සහගතය.

හැත්තෑව දශකයේ දී සිංගප්පූරුවේ සමාජයම බරපතල ආකාරයෙන් කිදා බැස තිබූ අවස්ථාවක එරට රජය වසංගතයක් තුරන් කරන ආකාරයට ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවා තිබුණි. නිදහස් දින පණිවිඩය නිකුත් කරමින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ යුද්ධය අවසන් කර දූෂණය තුරන් කිරීමට කටයුතු කරන බවය. එහෙත් අප කියන්නේ එතෙක් නොසිට මෙය වහාම කළ යුතු බවය. යුද්ධයේ ජයග්‍රහණයට ද මෙය බලපාන බව අමතක නොකළ යුතුය. දූෂණ ක්‍රියාවලියට එරෙහිව ජාතික ව්‍යාපාරයක් ගොඩනැගීම අවශ්‍යය.

ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම දැන් දැන් අපට දැනෙමින් තිබේ. ඒ දැනීම තුළ එක් පැත්තකින් සමාගම් විශාල සංඛ්‍යාවක් වැසී යමින් තිබේ. අපට විදේශ විනිමය උපයාදෙන ප්‍රධාන ව්‍යාපාර කීපයක් බංකොලොත් වෙමින් තිබේ. මේ නිසා රැකියා අවස්ථා අහිමිවීම, ආදායම් මාර්ග ඇනහිටීම සිදුවනු ඇත. එය බරපතල තත්ත්වයකි. අනෙක් අතට රජයේ අධික වියදම් හා දූෂණය නිසා උද්ධමනය ඉහළ යනු ඇත. මේ පසුබිම යටතේ අගෝස්තු මාසය පමණ වනවිට ලංකාව ඉතාම බරපතල තත්ත්වයකට මුහුණදීමට ඇති ඉඩකඩ වැඩිය.

මේ තත්ත්වය මෙසේ පවතිද්දී අප කරන්නේ මොනවාද? එය හරියට රෝමය ගිනි ගනිද්දී නිරෝ වීණා වැයුවා සේ ඇතිවෙමින් තිබෙන බරපතල තත්ත්වය සම්බන්ධයෙන් සමස්ත සමාජයටම අවබෝධයක් නැත. අප මෙවී ගමන් කරන ආකාරයක් දැකගත හැකිය. ඒ තුළ උත්සාහ කරන්නේ එකිනෙකා පෝෂණය කර ගැනීමටය. පවුල් පෝෂණය ගැන සිතා කතා කරනවා මිස රට ගැන සිතා කතා කරන්නේ නැත. දේශප්‍රේමය යනු යුද්ධය දිනීම පමණක් නොවේ. රට ගොඩනැගීමට දේශප්‍රේමී නායක පක්ෂයක් ද තිබිය යුතුය. ඒ තුළ ආර්ථික සංවර්ධනය, ශක්තිමත් රටක් ගොඩනැගීම, මානව හිමිකම්, මානව අභිමානය රැකීම, රටේම සංවර්ධනය යනාදී සියල්ල ඇතුළත් විය යුතුය. ඒ න්‍යාය පත්‍රය එළියට ගෙන ඒ ගැන සාකච්ඡාවක් ඇතිකර ඒ වෙනුවෙන් ජනතාව පෙළ ගැස්වීමට කාලය එළැඹ තිබේ. යුද්ධය අවසන් වී තිබේ. දැන් තිබෙන්නේ 21 වැනි සියවසට ඔබින ශක්තිමත් රාජ්‍යයක් ගොඩනගන්නේ කෙසේද යන්න න්‍යාය පත්‍රයේ පළමු තැනට පැමිණ තිබේ. මේ මැතිවරණ ප්‍රතිඵලවල තත්ත්වය කුමක් වුවත් සමාජයක් හැටියට අපේ ළඟමයිනේ, අපේ අනාගතයට ඉඩදීමට සුදුසු ශක්තිමත් රාජ්‍යයක්, සමාජයක් ගොඩනගන්නේ කෙසේද යන්න අවධානයට ලක්කළ යුතුය. අද දවසේ අපට තිබෙන අභියෝගය එයයි.

දූෂිත ක්‍රියාවලියට එරෙහි ජාතික ව්‍යාපාරයක්

දෝරේ ගැලීමක් සිදුවෙමින් තිබේ. අගහිඟකම, දුප්පත්කම දෙවැනි කරුණය. තුන්වැන්න පවුල් පෝෂණයයි. දූෂණය හා වෙනත් කුම භාවිත කරමින් විවිධ තරාතිරමවල අය තමන්ගේ මේ තරකර ගැනීමක් සිදුවෙමින් තිබේ. මේ බරපතල කරුණු තුන වත්මන් සමාජයේ වර්ධනය වෙමින් තිබේ.

ලංකාවේ වාර්ෂික ආදායම රුපියල් බිලියන 700ක් පමණය. මෙයින් බිලියන 550ක් ණය වාරික ගෙවීමට වෙන්වනු ඇත. ඒ අනුව රටට ඉතිරි වන්නේ රු.බි. 150ක් වැනි ප්‍රමාණයකි. ආහාරපාන, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනයට මාර්ග ඉදිකිරීම් ආදියට මේ මුදල ප්‍රමාණවත් නැත. මේ නිසා තව තවත් ණය ගැනීමට සිදුවනු ඇත. ඒ ගන්නා ණයවලින් සියයට පහහක් පමණ දූෂණයට ලක්වෙනවා නම් බරපතල ගැටලුවකට මුහුණ දීමට සිදුවනු ඇත. මෑත කාලීනව ගතහොත් හොඳම උදාහරණය වත්තේ මිහින් එයාර් සමාගමය. එහි සභාපතිවරයා පසුගියදා ඉල්ලා අස්වූයේ සමාගම ලාබදායක තත්ත්වයක පවත්වා ගැනීමට නොහැකි යන පදනමෙනි. දිනකට මිලියන තුනක් උපයාගත යුතු මිහින් එයාර් සමාගම අද

සටහන - **චමින්ද මුණසිංහ**

නවම් මස පෝය ලබන හෙට්ටෙන වේලාවන්

දිනය	පෝය	පෝය ප්‍රබල වේලාව	පෝය සෙසේන වේලාව
දෙසැ:02		ප.ව.03.23	03වා ප.ව.03.54
දෙසැ:09		ප.ව.11.20	09වා ප.ව.08.19
පෙබ:16		ප.ව.02.12	17වා ප.ව.04.09
පෙබ:24		ප.ව.05.59	25වා ප.ව.07.05